### I කොටස

- **වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ජීවීන් තම ආහාර අවශ්‍යතා සපුරා ගැනීම හඳුන්වනු ලබන්නේ,

   i. ශ්වසනය ii. ප්‍රභාසංස්ලේෂණය iii. පෝෂණය iv. වර්ධනය

2. ප්‍රභාසංස්ලේෂණයට අවශ්‍ය සාධකයක් නොවන්නේ,

   i. ජලය ii. ඔක්සිජන් iii. කාබන්ඩයොක්සයිඩ් iv. හරිතප්‍රද

3. පහත සත්ත්වයන් අතරින් සර්ව භක්ෂකයෙකු නොවන්නේ,

   i. කපුටා ii. ඇටි කුකුළා iii. මොණරා iv. කුකුළා

4. පහත ශාක අතරින් ශුෂ්ක පරිසරයක වැඩෙන ශාක විශේෂයක් වන්නේ,

   i. වැටකෙයියා ii. පතොක් iii. අඹ iv. සැල්වීනියා

5. කොඳු ඇට පෙළක් නැති සත්ත්වයෙකු වන්නේ,

   i. අලියා ii. කටුස්සා iii. බූවල්ලා iv. මත්ස්‍යයා

6. පහත සඳහන් ප්‍රකාශ අතරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

   i. ශාක හා සතුන් පමණක් ජීවීන් ලෙස සලකනු ලබයි.
   ii. ශාක සහ සතුන් අතර සමානකම් මෙන්ම වෙනස්කම් ද දක්නට ඇත.
   iii. සතුන්ට මෙන්ම ශාක වලට ද පෝෂණය අවශ්‍ය වේ.
   iv. සතුන් මෙන්ම ශාක ද චලනය දක්වයි.

7. සංචරණය කළ හැකි ජීවියෙකු වන්නේ,

   i. මුහුදු මල ii. මුහුදු අශ්වයා iii. මුහුදු පැළැටි iv. කොරල් බහුබාවා

8. ජීවීන්ගේ ප්‍රජනනය සඳහා නිදසුනක් වන්නේ,

   i. බිත්තරයකින් පැටවෙකු බිහිවීම. ii. ශාක බීජයකින් නව ශාකයක් ඇති වීම.
   iii. එළදෙනෙකුගෙන් පැටවකු බිහිවීම. iv. ඉහත සියල්ලම.

9. ශාක සහ සතුන් දෙවර්ගයම බැහැර කරනු ලබන බහිස්‍රාවී ද්‍රව්‍යයක් වන්නේ,

   i. ඩහදිය ii. මුත්‍රා iii. කාබන්ඩයොක්සයිඩ් iv. ලවණ

10. පහත සත්ත්වයන් අතරින් මත්ස්‍යයෙකු නොවන්නේ,

    i. තෝරා ii. තල්මසා iii. තිලාපියා iv. සූඩයා

**(ලකුණු 2×10=20)**

## II කොටස

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

01.



i. ඉහත රූප සටහනෙන් දැක්වෙන්නේ ජීවියෙකුගේ කුමන ලක්ෂණය ද?

________________________ **(ල 03)**

ii. ඔබ සඳහන් කළ ලක්ෂණයට අමතරව ජීවීන්ට පොදු ලක්ෂණ 2ක් සඳහන් කරන්න.

________________________________________

________________________________________

**(ලකුණු 3×2=06)**

iii. ඉහත රූප සටහනේ දැක්වෙන ජීවීන්ට පොදු ලක්ෂණය සඳහා ශාක හා සතුන් අතර ඇති වෙනස්කමක් සඳහන් කරන්න.

________________________________________

________________________________________

**(ල 03)**

iv. ශාකයක වර්ධනය මැනීම සඳහා භාවිතා කළ හැකි සරළ උපකරණයක නම ලියන්න.

________________________________________

**(ල 03)**
**(මුළු ලකුණු 15)**

02. 6 ශ්‍රේණියේ සිසුවෙකු ශාක සම්බන්ධව කළ ප්‍රකාශයක් පහත දැක්වේ.

"සෑම සත්ත්වයෙකුට ම ශාක මත ඍජුවම හෝ වක්‍ර ලෙස යැපීමට සිදුවේ. මන්ද ශාක යනු ස්වයංපෝෂීන් හෙවත් ප්‍රාථමික නිෂ්පාදකයන් වේ."

i. ශාක ස්වයංපෝෂීන් ලෙස හැඳින්වීමට හේතුව කුමක්ද?

________________________________ **(ල 03)**

ii. ශාක තුළ සිදුවන ආහාර නිපදවීමේ ක්‍රියාවලිය හඳුන්වන නම කුමක්ද?

__________________________ **(ල 03)**

iii. ශාක වල ආහාර නිපදවීමේ ක්‍රියාවලියට අවශ්‍ය සාධක 2ක් ලියන්න.

________________________________

________________________________ **(ල 02)**

iv. ශාක තුළ ආහාර නිපදවීමේ දී සෑදෙන ප්‍රධාන ඵල 2ක් සඳහන් කරන්න.

______________________________________________

______________________________________________ (ල 02)

v. සතුන් ඔවුන්ගේ භෝජන විලාසය අනුව බෙදෙන ප්‍රධාන කොටස් 3ක් නම් කරන්න.

______________________________________

______________________________________

______________________________________ (ල 03)

v. ආහාර නිපදවීම සම්බන්ධව ශාක තුළ දක්නට ලැබෙන නමුත් සතුන් තුළ දක්නට නොලැබෙන වර්ණකය කුමක් ද?

______________________________________ (ල 02)

**(මුළු ලකුණු 15)**

03. පහත වගුව සම්පූර්ණ කරන්න.

| **සත්ත්වයා** | **සංචරණ ක්‍රම** | **සංචරණය සඳහා වූ උපාංග** |
|---|---|---|
| උකුස්සා | ______________ | පියාපත් |
| මාළුවා | ______________ | ______________ |
| ගැරඬියා | බඩ ගා යාම | ______________ |
| අශ්වයා | දිවීම | ______________ |

**(මුළු ලකුණු 2×5=10)**

04. පහත දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

i. බැක්ටීරියා යනු ක්ෂුද්‍ර ජීවී කාණ්ඩයට අයත් ජීවියෙකි. ( )

ii. සියලුම සතුන්ට සංචරණය කළ හැක. ( )

iii. ජීවීන් ආශ්වාසය සඳහා යොදාගන්නේ ඔක්සිජන් වායුවයි. ( )

iv. නව ජීවීන් බිහි කිරීමේ ක්‍රියාවලිය ප්‍රජනනය ලෙස හඳුන්වයි. ( )


v. සතුන්ට චලන දැක්විය හැකි නමුත් ශා චලනය නොදක්වයි. ( )

05. නිවැරදි වචන යොදමින් පහත දක්වා ඇති ඡේදය සම්පූර්ණ කරන්න.

ජීවීන් ප්‍රාශ්වාසයේ දී ______________ වායුව පිට කරයි. එය විද්‍යාගාරයේ දී හඳුනාගැනීම සඳහා ______________ භාවිතා කරයි. එහි දී ලැබෙන නිරීක්ෂණය වන්නේ අදාළ ද්‍රාවණය ______________ වීමයි. ප්‍රාශ්වාසයේ දී පිට කරන වායුව ශාක මගින් ______________ ක්‍රියාවලිය සඳහා යොදා ගනී. එහෙත් ශාක ද රාත්‍රී කාලයේ දී ______________ වායුව පිට කරයි.

**(ලකුණු 2×5=10)**

06. පහත දක්වා ඇති දෙබෙදුම් සුචිය සම්පූර්ණ කරන්න.




**(ලකුණු 2×10=20)**

For more past papers and exam resources,visit **www.pastpaperszone.lk**